දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට
மாவட்ட செயலகம் – ஹம்பாந்தோட்டை

"සෞභාග්‍යමත් අනාගතයක් උදෙසා"
"For a prosperous future"

1 වන මහල, මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණය, සිරිබෝපුර, හම්බන්තොට.
1st Floor, Magam Ruhunupura Administrative Complex, Siribopura, Hambantota


| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No | DSH/DPS/07/DCC/වාර්තා/2025 | ඔබේ අංකය / உமது இலக்கம் / You're No | |
| දිනය / திகதி / Date | 2025.11.14 | | |

හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ
සියලුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

**<u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව - *2025.11.06*</u>**

*2025.11.06* වන දින පවත්වන ලද හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවමි.

02. එම වාර්තාවේ ඔබ ආයතනයට අදාළ කාර්යයන් ඉතා කඩිනමින් සාර්ථකව ඉටුකිරීමටත්, ඒ සඳහා අවශ්‍ය වෙනත් ආයතනවල සහයෝගය ලබා ගන්නා ලෙසත් දන්වා සිටින අතර, එම කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටළු නිරාකරණය කිරීම සඳහා අපගේ සහයෝගය අවශ්‍ය අවස්ථාවලදී නොපමාව ඒ පිළිබඳ දන්වා අවශ්‍ය කටයුතු සම්පාදනය කරගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලමි.

03. එසේම, මීලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කිරීම සඳහා ඉහත වාර්තාවේ ඔබ වෙත පැවරී ඇති වගකීම් ඉටුකිරීම පිළිබඳ ප්‍රගතිය 2025.12.10 දිනට හෝ ඊට ප්‍රථම මා වෙත *DCC Hambantota WhatsApp* වෙත හෝ *dpshambantota@gmail .com* වෙබ් ලිපිනයට ලබා දීමට කටයුතු කරන ලෙස ද ඉල්ලමි.

04. තවද, මෙම වාර්තාව *www.hambantota.dist.gov.lk* දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ද ලබා ගත හැකි බව කාරුණිකව දැනුම් දෙමි.

බිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

පිටපත්:-

01. හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති හා හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමා - කරු.දැ.ගැ.ස
02. දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර හා හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති එම්.කේ.බන්දුල හරිස්චන්ද්‍ර මැතිතුමා - කරු.දැ.ගැ.ස.
03. ජනාධිපති ලේකම් - දැ.ගැ.ස
04. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - දැ.ගැ.ස.


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් / மாவட்ட செயலாளர் / District Secretary | 047 2256235 | අතිරේක දිස්ත්‍රික් ලේකම්(පාලන) / மேலதிக மாவட்ட செயலாளர் (நிர்வாகம்) / Additional District Secretary (Admin) | 047 2256232 | අතිරේක දිස්ත්‍රික් ලේකම්(ඉඩම්) / மேலதிக மாவட்ட செயலாளர் (காணி) / Additional District Secretary (Land) | 047 2256002 | ප්‍රධාන ගණකාධිකාරී / கணக்காளர் / Chief Accountant | 047 2256246 |
| අධ්‍යක්ෂ (කෘෂිකර්ම) / பணிப்பாளர் (விவசாயம்) / Director (Agriculture) | 047 3628890 | අධ්‍යක්ෂ (සැලසුම්) / பணிப்பாளர் (திட்டமிடல்) / Director (Planning) | 047 2256234 | සහකාර දිස්ත්‍රික් ලේකම් / உதவி மாவட்ட செயலாளர் / Assistant District Secretary | 047 2256945 | පරිපාලන නිලධාරී / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer | 047 2256285 |
| කාර්යාලය / அலுவலகம் / Office | | ෆැක්ස් / தொலை நகல் / Fax | 047 2256235<br>047 2256247 | ඊ මේල් / மின்னஞ்சல் / email moha.dist.hambantota@gmail.com<br>වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.hambantota.dist.gov.lk | | | |

# <u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම - 2025.11.06</u>

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති, හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමාගේ හා පළාත් සභා හා පළාත් පාලන ගරු නියෝජ්‍ය අමාත්‍ය පී. රුවන් සෙනරත් මැතිතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් හා අනෙකුත්දේශපාලන නායකත්වයෙන් මෙන්ම රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2025.11.06 වන දින පෙ.ව. 9.00ට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

රැස්වීමට සහභාගී වූ ගරු සම සභාපතිතුමා, නියෝජ්‍ය අමාත්‍යවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පළාත් පාලන ආයතනවල ගරු නගරාධිපති හා සභාපතිවරුන් ඇතුළු දේශපාලන නායකත්වය හා අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් දිස්ත්‍රික් ලේකම් තුමා විසින් පිළිගනිමින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අරවින්ද සෙනරත් විතාරණ මැතිතුමා වෙත නියෝජ්‍ය අමාත්‍යධුරයක් ලැබීම දිස්ත්‍රික්කයට ආඩම්බරයක් බව පවසන ලදී.

මේ වනවිට, දිස්ත්‍රික්කයේ සංවර්ධන ව්‍යාපෘතිවල ඉලක්කගත අවසන් ප්‍රගතිය ලගාකර ගැනීමට කටයුතු කරන අවස්ථාවේ පවත්වන සම්බන්ධීකරණ කමිටුව ඉතාමත් වැදගත් බවත් දෙසැම්බර් මස මැද භාගයේ මීලග සම්බන්ධීකරණ කමිටුව පැවැත්විය යුතු බවත් ඒ හා සමගාමීව අමාත්‍යාංශ වෙත වාර්ෂික ප්‍රගතිය වාර්තාකිරීම් සිදුවිය යුතු බවත් මේ සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මකව ඉහළ ප්‍රගතියක් ලබා දීමට සියළුදෙනා උත්සාහ කරන ලෙස ඉල්ලා සිටින ලදී.

තවද, ක්ලීන් ශ්‍රී ලංකා ජාතික වැඩසටහනට සමගාමීව දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ක්ලීන් ශ්‍රී ලංකා ජංගම සේවා සහ විශේෂ ජන සත්කාරක වැඩසටහන ප්‍රදේශයේ ජනතාවට "සේවය, සුවය සහ සංස්කෘතිය එකවර ලගාකර ගැනීම" ප්‍රධාන අරමුණ හා තවත් සුවිශේෂී අරමුණු ඇතිව 2025.11.26 සහ 27 යන දෙදින ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ තිස්සමහරාම සහ සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ඒකාබද්ධ කර ගනිමින් ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති අතර සේවාවන් ලබාගැනීමට සහභාගීවිය හැකියැයි බලාපොරොත්තුවන පිරිස සම්බන්ධව තොරතුරු සහ සහයෝගයන් මොනවාද යන්න 2025.11.12 වන දිනට පෙර දැනුම් දෙන ලෙසත් සියළුදෙනාගේ සහයෝගය මේ සඳහා ලබාදෙන ලෙසත් දැනුම් දෙන ලදී.

2025 වර්ෂයේ ජාතික මට්ටමින් දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම 2025.12.25 සහ 26 දෙබරවැව ජාතික පාසලේ පැවැත්වීමට නියමිත බවත් 27 වන දින හම්බන්තොට ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ අවසන් උත්සවය පැවැත්වීමට සැලසුම් කර ඇති අතර මේ සඳහා සෑම දිස්ත්‍රික්කයකින්ම විශාල දරුවන්, දහම් පාසල් ගුරුවරුන්, දෙමාපියන් ආදී විශාල පිරිසක් ඒකරාශි වන හෙයින් ඔවුන් වෙනුවෙන් යටිතල පහසුකම් හා අවශ්‍ය අනෙකුත්පහසුකම් අප සැපයියුතු බැවින් ඊට විශාල මුදලක් වැයවන බවත් මේ සඳහා දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගේ සහයෝගය බලාපොරොත්තුවන බවත් අනෙක් සියළුම දේශපාලන හා රාජ්‍ය ආයතනයන්ගෙන් ලබා දියහැකි සහයෝගයන් ලබාදීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

එසේම, හම්බන්තොට අලි කළමනාකරණ රක්ෂිතය වටා පිහිටි ගම්මාන හා අවශේෂ කැලෑ ආශ්‍රිතව වෙසෙන වන අලි හේතුවෙන් වන අලින්ගෙන් ජන ජීවිතවලට හා ඔවුන්ගේ දේපලවලට, වගාවන්ට හානිවීම් සිදුවීම තුළ ආරක්ෂාව සොයන ජනතාවගෙන් වන අලින්ට ද හානියක් සිදුවිය හැකි බැවින් දිස්ත්‍රික්කයේ අදාල සියළු අංශ එක්වී සහයෝගයෙන් විද්‍යාත්මක පදනමක් මත මෙකී දෙපාර්ශවයටම හානියක් නොවන අයුරින් ක්‍රමවත්ව වන අලින් යෝජිත රක්ෂිතයට යොමු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන බවත් මෙකී දෙපාර්ශවය මුහුණදෙන ගැටළු දෙස සාධාරණ පදනමකින් බැලිය යුතු බවත් මෙකී ක්‍රියාවලියෙහි නිවැරැදි තත්ත්වය පිළිබඳ සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම රාජ්‍ය නිලධාරීන්ගේ වගකීමක් බව වැඩිදුරටත් පැහැදිලි කරන ලදී.

අනතුරුව, ගරු සම සභාපතිතුමා වෙත රැස්වීමේ ඉදිරිකටයුතු කරගෙන යාම සඳහා ආරාධනා කල අතර සභාපතිතුමා සහ පළාත් සභා හා පළාත් පාලන ගරු නියෝජ්‍ය අමාත්‍ය ප්‍රභා රුවන් සෙනරත් මැතිතුමා එක්ව රැස්වීමේ ඉදිරි කටයුතු කරගෙන යාම සිදු කරන ලදී.

ඒ අනුව, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් පැමිණ සිටි සියළුම දෙනා පිළිගැනීමෙන් පසු 2025 ඔක්තෝම්බර් මස 10 සහ 11 දිනවල හම්බන්තොට වෙරළ උද්‍යානයේදී දකුණු පළාත් සංස්කෘතික හා කළා කටයුතු අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද දක්ෂිණ පුනරුද සාහිත්‍ය කලා මහෝත්සවය යටතේ පැවැත්වූ සාහිත්‍යමය වැඩසටහන ඉතා ඉහල මට්ටමින් සිදු වුන බවත් එසේ සාර්ථකව සිදුකිරීම සඳහා සහයෝගය ලබාදුන් සියළු පාර්ශව වෙත සහ දිස්ත්‍රික්කයේ සියළුම නිලධාරීන් වෙත ස්තුතිය පිරිනමන ලදී. එසේම, වර්ෂ අවසානයට පෙර මෙම රැස්වීම පැවැත්වීමේ වැදගත්බව තවදුරටත් අනාවරණය කරමින් පසුගිය වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීමෙන් පසු රැස්වීම් වාර්තාව සභා සම්මත කර න්‍යාය පත්‍රයට අනුව සභාවේ කටයුතු සිදු කරන ලදී. එහිදී සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01. | 2025.09.30 දිනැති සම්බන්ධීකරණ රැස්වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම. | | | |
| 1.1 | මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය පිහිටි ටවර්හිල් ප්‍රදේශය සංචාරක | ටවර්හිල් ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරාදීමට අදාලව ඉඩම හඳුනාගැනීම සඳහා 2025/144 | ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා කඩිනමින් අදාල මැනුම් වාර්තාව | ප්‍රාදේශීය ලේකම්, හම්බන්තොට. |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | ගමනාන්තයක් බවට පත් කිරීමට යෝජනා කිරීම. | අංක දරණ මැනුම් ඉල්ලීම මිනින්දෝරු කාර්යාලය වෙත යොමු කර ඇති බවට කරුණු ඉදිරිපත් විය. | ලබා දීමට කටයුතු කරන ලෙසත් අදාල බිම් කොටස් නාගරික සංවර්ධන අධිකාරියට පැවරීමේ කටයුතු කඩිනම් කරන ලෙසත් උපදෙස් දෙන ලදි. | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී, හම්බන්තොට<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය<br>සහකාර අධ්‍යක්ෂ, ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය<br>කෞතුකාගාර අධිකාරී, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව. |
| 1.2 | පාසල් දන්ත චිකිත්සාගාරයක් ආරම්භ කිරීම. | හම්බන්තොට හා අම්බලන්තොට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයන් තුළ පාසල් දන්ත චිකිත්සාගාරයක් නොමැති හෙයින් ලගාවීමේ පහසුවද සලකාබලා, මිරිජ්ජවිල මහ විද්‍යාලයේත් භුංගම විජයබා ජාතික පාසලේත් ආරම්භ කිරීමට අදාලව ප්‍රමාණවත් ඉඩපහසුකම් සම්බන්ධව සාකච්ඡාවට ලක්විය. | මිරිජ්ජවිල මහා විද්‍යාලයෙන් මේ සඳහා පංති කාමරයක් වෙන්කර දීමට තීරණය වූ අතර අවශ්‍ය පහසුකම් අදාල පරිදි සංවිධානය කර කඩිනමින් මෙකී දන්ත චිකිත්සාගාර ආරම්භ කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, හම්බන්තොට |
| 1.3 | වීරකැටිය රෝහලෙහි තාප්පය ඉදිකරන ස්ථානයේ බෝගසක් පැවතීමෙන් බාධා මතුවීම. | වීරකැටිය ප්‍රාදේශිය සභාවේ JCB යන්ත්‍රය උපයෝගීකරගනිමින් කුලී පදනම මත කැපුම් කරුවකු යොදවා මෙම බෝ ගස ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇති බවත් මෙම සතිය ඇතුළත මෙකී බෝගස ඉවත්කිරීමට කටයුතු කරන බවට කරුණු ඉදිරිපත් විය. | මෙකී කටයුත්ත කඩිනමින් සිදුකරන ලෙස උපදෙස් දෙන ලදි. | සහකාර අධ්‍යක්ෂ, ආපදා කළමනාකරණ අංශය |
| 1.4 | අඟුණකොළපැලැස්ස නගර මධ්‍යය තුළ අඩක් ඉදිකර අතරමඟ නතරකර ඇති වෙළඳ සංකීර්ණය. | මෙම වෙළඳ සංකීර්ණය අඩක් ඉදිකර අතරමඟ නතරකර ඇති තත්ත්වය තුළ ගැටළු පැන නැගී ඇති බවත් අධිකාරියට ඉතිරි වැඩ නිම කිරීමට හැකියාවක් නොමැති නම් සභාවේ ප්‍රතිපාදන මත එම වැඩ නිම කිරීමට ප්‍රාදේශීය සභාවට විධිමත් පරිදි ලබාදීමට ඇති හැකියාව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (ව්‍යාපෘති කළමනාකරණ) වෙතින් විමසීම් කර ඇති බවට කරුණු ඉදිරිපත් විය. | ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීමට අදාල කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් දෙන ලදි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය |



බිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2.1 | **සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය ඉදිරිපත් කිරීම.** | | | |

මෙම වසර තුළ සංවර්ධන වැඩසටහන් 08 ක් යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි.707 ක් ලබාදී ඇති බවත් ඒවා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් බෙදී ගොස් ඇති ආකාරය පහත පරිදි ඉදිරිපත් කරන ලදි.

| ප්‍රතිපාදන ලැබීම් (රු.මි.) - 2025 | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | DS | DCB | DDP | RR1 | RR2 | Tourist | Sport | IRDP | Nila/Se | Total |
| 1 | කටුවන | 6 | 7 | 8 | 4 | - | 3.4 | - | 9.62 | 38.02 |
| 2 | වලස්මුල්ල | 6 | 7 | 8 | 6 | - | 2 | - | 5.65 | 34.65 |
| 3 | වීරකැටිය | 6 | 7 | - | 6 | - | - | 0.41 | 9.11 | 28.52 |
| 4 | ඕකෙවෙල | 5 | 7 | 8.5 | 85 | - | - | - | 2.58 | 108.08 |
| 5 | බෙලිඅත්ත | 7 | 7 | 13.5 | 11 | - | 2 | - | 16.65 | 57.15 |
| 6 | තංගල්ල | 10 | 6 | - | 16 | 5 | 3.3 | 2.26 | 13.93 | 56.49 |
| 7 | අඟුණකොළපැලැස්ස | 6 | 7 | 5 | 50.2 | - | - | 50.23 | 12.56 | 130.99 |
| 8 | අම්බලන්තොට | 10 | 7 | 11 | 15 | 10 | 2 | - | 6.05 | 61.05 |
| 9 | හම්බන්තොට | 6 | 7 | - | 62 | - | - | 0.91 | 2.94 | 78.85 |
| 10 | සූරියවැව | 6 | 7 | 5 | 7 | - | - | - | 4.47 | 29.47 |
| 11 | තිස්සමහරාම | 6 | 7 | 8.2 | 6 | 2 | 3.3 | - | 9.07 | 41.57 |
| 12 | ලුණුගම්වෙහෙර | 6 | 7 | 12 | 16 | - | - | - | 1.16 | 42.16 |
| | **Total** | **80** | **83** | **79.2** | **284** | **17** | **16** | **53.81** | **93.79** | **707** |

| | | | | |
|---|---|---|---|---|
| 2.1.1 | විමධ්‍යගත අයවැය වැඩසටහන | මේ යටතේ හඳුනාගත් ව්‍යාපෘති 49 න් 41 ක් අවසන් කර ඇති බවත් එහි භෞතික ප්‍රගතිය 84% බවත් මූල්‍ය ප්‍රගතිය 38%ක් බවත් ප්‍රකාශ කරන ලදි. එමෙන්ම කටුවන ,වීරකැටිය , හම්බන්තොට, සූරියවැව සහ තිස්සමහරාම කොට්ඨාසවල ක්‍රියාත්මක වන ඉතිරි ව්‍යාපෘති 08 ද මෙම මස 15 වන දින වන විට අවසන් කලයුතු බවත් දැනුම් දෙන ලදි. | අදාල ව්‍යාපෘති කඩිනම් කරන ලෙස පවසන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br>දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන් |
| 2.1.2 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන | පළමු අදියර සඳහා ලබා දුන් රු.මි.79.2 ට අදාල ව්‍යාපෘති 38 න් මේ වන විට ව්‍යාපෘති 15 ක් අවසන් කර ඇති බවත් ලුණුගම්වෙහෙර කොට්ඨාසයේ එක් ව්‍යාපෘතියක වැඩ ආරම්භ කර නොමැති බවත් අනෙක් ව්‍යාපෘති 12 ම ක්‍රියාත්මක වන බවත් දන්වන ලදි.<br>එමෙන්ම දෙවන අදියර යටතේ ලබා දුන් රු.මි.284.29 ට අදාල ව්‍යාපෘති 48 න් ව්‍යාපෘති 02 ක් අවසන් බවත් ව්‍යාපෘති 36 ක වැඩ ආරම්භ කර ඇති බවත් ඕකෙවෙල, බෙලිඅත්ත, තංගල්ල, අඟුණකොළපැලැස්ස හම්බන්තොට, තිස්සමහරාම සහ ලුණුගම්වෙහෙර කොට්ඨාසවල වැඩ ආරම්භ නොකල ව්‍යාපෘති 10 ක් පවතන බවත් දන්වන ලදි.<br>විශේෂයෙන්ම ව්‍යාපෘති ප්‍රමාදවීමට | ව්‍යාපෘති ප්‍රමාදවී ඇති කාර්යාල ඒ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරන ලෙසත් වසරකට දෙවතාවක් වත් මිල ගණන් සකස් කිරීම සඳහා අදාල පාර්ශව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් උපදෙස් ලදි. | දිස්ත්‍රික් ලේකම්<br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br>දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන්<br>ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය<br>දිස්ත්‍රික් ඉංජිනේරු, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br>සියළුම පලාත් පාලන ආයතන ප්‍රධානින්, |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | බලපාන හේතුවක් වන්නේ කොන්ත්‍රාත් කරුවන්ට ලැබෙන ලාභය ප්‍රමාණවත් නොවීම බවත් ඊට බලපාන ප්‍රධාන හේතුව ලෙස ඇස්තමේන්තු සකස් කිරීමට යොදාගන්නා මිලගනන් (Rates) යාවත්කාලීන නොවීම බව දැනුම් දෙන ලදි. වසර ආරම්භයේදී භාවිතා කරන ලද මිල ගණන් වසර අවසාන වන විට විශාල ලෙස වෙනස් වීම නිසා ලාභ අඩුවී ඇති බව දන්වන ලදි. | | |
| 2.1.3 | නිලසෙවන කාර්යාල වල යටිතල පහසුකම් හා අළුත්වැඩියා කිරීම - 2025 | මෙම වැඩසටහන සඳහා 2025.10.13 දින ලැබුණු අලුත් යෝජනා සමඟ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 129 ක් දක්වා ඉහල ගිය බවත් දැනටමත් ව්‍යාපෘති 69 ක් අවසන් කර මිලියන 14.85 ක වියදමක් දරා ඇති බවත් එහි භෞතික ප්‍රගතිය 53% ක් හා මූල්‍ය ප්‍රගතිය 16% ක් බවත් දන්වන ලදි. | | දිස්ත්‍රික් ලේකම්<br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br>අදාල ප්‍රාදේශිය ලේකම්වරුන් |
| 2.1.4 | දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන. | මෙම වැඩසටහන යටතේ රු.මි.83 ක් වෙන්කර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් හඳුනාගෙන ඇති ව්‍යාපෘති 51 ක් අතුරින් දැනටමත් ව්‍යාපෘති 11 ක් අවසන් කර 22% ක භෞතික ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති බවත් ඕකෙවෙල හා ලුණුගම්වෙහෙර කොට්ඨාසවල ආරම්භ නොකල ව්‍යාපෘති 02 ක් පවතින බවත් ඉතිරි ව්‍යාපෘති 38 ක්‍රියාත්මක යමට්ටමේ පවතින බවත් දැනුම් දෙන ලදි. | අදාල ව්‍යාපෘති කඩිනම් කරන ලෙස පවසන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br>දිස්ත්‍රික්කයේ අදාල ප්‍රාදේශිය ලේකම්වරුන්<br>කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ, හම්බන්තොට / තංගල්ල/ වලස්මුල්ල |
| 2.1.5 | ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන | මෙම වැඩසටහන යටතේ ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් රු.මි. 53.38 ක් ලබාදී ඇති බවත් ඒවා සාර්ථකව ක්‍රියාත්මක වන බවත් දන්වන ලදි. | | දිස්ත්‍රික් ලේකම්<br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br>දිස්ත්‍රික්කයේ අදාල ප්‍රාදේශිය ලේකම්වරුන් |
| 2.1.6 | සංචාරක සංවර්ධන වැඩසටහන | තංගල්ල, අම්බලන්තාට සහ තිස්සමහරාම කොට්ඨාසවලට ව්‍යාපෘති 06 ක් අනුමතවී ඇති බවත් ඒ සඳහා රු.මි.17ක ප්‍රතිපාදන ලබා දී ඇති බවත් ඒවා සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතින බවත් දන්වන ලදි. | අල ව්‍යාපෘති කඩිනම් කරන ලෙස පවසන ලදි. | |
| 2.1.7 | ග්‍රාමීය පාසල් සඳහා ක්‍රීඩා උපකරණ ලබාදීම හා ක්‍රීඩා පිටි සැකසීම. | ක්‍රීඩා සංස්කෘතියක් බිහිකිරීමේ ජාතික වැඩසටහන යටතේ ව්‍යාපෘති 06 ක් වෙනුවෙන් රු.මි. 16 ක් ලබා දී ඇති බවත් ඒ වෙනුවෙන් කටුවන, වලස්මුල්ල, බෙලිඅත්ත, අම්බලන්තොට, සහ තිස්සමහරාම කොට්ඨාසවල ව්‍යාපෘති ක්‍රියාත්මක වන බවත් දන්වන ලදි. | | දිස්ත්‍රික් ලේකම්<br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br>අදාල ප්‍රාදේශිය ලේකම්වරුන් |
| 2.1.8 | 2025.10.30 දිනට අනෙකුත් ආයතනවල සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය විමසීම. | එක් එක් ආයතන මඟින් ඉදිරිපත් කරන ලද ප්‍රගතිය සම්බන්ධව යම් යම් වෙනස්කම් හා සංශෝධන ඉදිරිපත්වූ හෙයින් අදාල ආයතනවල ප්‍රගතිය විමසීමකින් පසුව ඉදිරිපත් කිරීමට තීරණය විය. එකී ආයතනවලින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු තොරතුරු ලබා ගැනීමට නිශ්චිත නිලධාරියෙක් නම්කර ගැනීම සුදුසු බවටත් යෝජනා විය. | | |

නිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට



CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2.2 | **2025.07.11 දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී යෝජනා වූ සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය ඉදිරිපත් කිරීම.** | | | |
| 2.21 | හම්බන්තොට මහ රෝහල වෙත රු.මි. 70ක ප්‍රතිපාදන වෙන් කිරීම. | මීට අදාල සියළු කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යාලයෙන් සිදුකරමින් පවතින බවටත් මේ වසර අවසානය වන විට මූලික කටයුතු අවසන් කල හැකි බවත් ලබන වසර මුල ඉදිකිරීම් ආරම්භ කිරීමටත් සැලසුම් කරමින් පවතින බවට කරුණු ඉදිරිපත් විය. | කඩිනමින් අදාල කටයුතු සිදුකරන ලෙස උපදෙස් දෙන ලදී. | රෝහල් අධ්‍යක්ෂ, මහරෝහල, හම්බන්තොට |
| 2.2.2 | කිරින්ද ධීවර වරායේ ගොඩගැසී ඇති වැලි ඉවත් කිරීම සඳහා රු.මි 26ක් වෙන් කිරීම. | දින 150 ක් තුළ නිම කිරීමට සැලසුම් කර ඇති බවත් මෙම වැලි බහාලන නිදන්ගල ස්ථානයේ ධීවර රැකියාවේ නියුතු ධීවරයින් මෙම වැලි බහාලීම හේතුවෙන් ඉස්සන් බෝවීම අඩුවන බවට මැසිවිලි නගන බවත් මෙම ගැටලුව සඳහා විසඳුමක් සොයමින් වැලි බහාලීම සිදුකිරීම වඩා සුදුසු බවට කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධව කරුණු සොයාබලා වැලි බහාලීමට යෝජනා කරන ලද විකල්ප ස්ථානයද සැලකිල්ලට ගනිමින් මෙම ගැටලුවටත් විසඳුමක් ලබා දෙමින් වඩා සුදුසු පරිදි කටයුතු සිදුකරන ලෙස උපදෙස් දෙන ලදී. | වරාය කළමනාකරු, කිරින්ද ධීවර වරාය |
| 2.2.3 | පළමු අදියර යටතේ අත්‍යාවශ්‍ය පාලම් ප්‍රතිසංස්කරණය සඳහා රු.මි 200ක් වෙන් කිරීම. | ප්‍රමුඛතාවය මත හඳුනාගත් ප්‍රධාන පාලම් 05 අතුරින් පල්ලෙකන්ද පාලමේ වැඩ ආරම්භ කර ඇති බවත් අනෙක් පාලම්වල වැඩ කොටස් ආරම්භ කිරීමට කටයුතු කරන බවත් ඒ සඳහා අවශ්‍ය මූලික කටයුතු සූදානම් කරන බවත් දැනුම් දෙන ලදී. | අදාල කටයුතු කඩිනම් කරන ලෙස පවසන ලදී. | ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය. |
| 2.3 | Clean Sri Lanka වැඩසටහන සම්බන්ධව දැනුවත් කිරීම. | රජයේ ප්‍රමුඛතම වැඩසටහන් ත්‍රිත්වයෙන් එකක් වන මෙම වැඩසටහන යටතේ මෙම වසර තුළ මහජනතාව වෙනුවෙන් "**සේවය, සුවය, සහ සංස්කෘතිය**" යන තේමාව මුල්කරගනිමින් ජනතාවගේ නොවිසිදුණු ගැටළු විසඳීම සඳහා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයක් හෝ කිහිපයක් එක් රැස්කරගනිමින් ජංගම සේවා පැවැත්වීමට කටයුතු කරන ලෙස ජනාධිපති ලේකම් කාර්යාලයෙන් උපදෙස් ලැබී ඇති බවත් ඒ වෙනුවෙන් රු.මි. 03 ක ප්‍රතිපාදනයක් ලබාදීමට කටයුතු කරන බවත් දන්වන ලදී.<br>තවද, මේ සඳහා ලුණුගම්වෙහෙර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය කේන්ද්‍රකරගනිමින් වැඩසටහන් සකස් කරමින් පවතින බවත් තිස්සමහාරාම සහ සූරියවැව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසද මේ සඳහා සම්බන්ධ කර ගැනීමට කටයුතු කරන බවත් දැන්වීය. | මෙකී වැඩසටහන සාර්ථකව සිදුකිරීම සඳහා මේ පිළිබඳව සියළු පාර්ශව දැනුවත් කරමින් නොමිලේ ලබාදියහැකි සෑම සේවාවක්ම ඒ ඒ ආයතනවලින් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම්,<br><br>ප්‍රාදේශිය ලේකම්, ලුණුගම්වෙහෙර, තිස්සමහරාම, සූරියවැව<br><br>අදාල අනෙකුත් ආයතන ප්‍රධානීන් |
| **03.** | පළාත් සභා සංවර්ධන වැඩසටහන් සම්බන්ධව දැනුවත් කිරීම. | සියළු ව්‍යාපෘති සම්බන්ධව මෙහිදී ප්‍රගතිය විමසීමක් සිදු කරන ලද අතර 2025.10.30 දිනට දැනුම් දෙන ලද ප්‍රගතිය පහත පරිදි ඉදිරිපත් කර ඇත. | | ප්‍රධාන ලේකම්, දකුණු පළාත<br><br>අමාත්‍යාංශ ලේකම්වරුන්, දකුණු පළාත් සභාව |

.නිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට



CamScanner

<table>
<tr><th rowspan="2">අ.අ.</th><th>කාරණය</th><th colspan="3">සාකච්ඡා වූ කරුණ</th><th colspan="2">තීරණය</th><th>වගකීම</th></tr>
<tr><td>අමාත්‍යාංශය</td><td>අනුමත ප්‍රතිපාදන මුදල රු.මි.</td><td>අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව</td><td>ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සංඛ්‍යාව</td><td>වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව</td><td>වියදම රු.මි.</td><td rowspan="6">නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සැලසුම් හා මෙහෙයුම් (දකුණු පළාත)<br><br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්</td></tr>
<tr><td></td><td>ප්‍රධාන අමාත්‍යාංශය</td><td>572.37</td><td>239</td><td>194</td><td>40</td><td>70.55</td></tr>
<tr><td></td><td>කෘෂිකර්ම අමාත්‍යාංශය</td><td>386.19</td><td>147</td><td>100</td><td>43</td><td>98.38</td></tr>
<tr><td></td><td>ධීවර අමාත්‍යාංශය</td><td>293.51</td><td>98</td><td>89</td><td>9</td><td>83.39</td></tr>
<tr><td></td><td>ක්‍රීඩා අමාත්‍යාංශය</td><td>132.64</td><td>66</td><td>49</td><td>17</td><td>42.14</td></tr>
<tr><td></td><td>අධ්‍යාපන අමාත්‍යාංශය</td><td>463.58</td><td>91</td><td>43</td><td>47</td><td>63.78</td></tr>
<tr><td>04.</td><td>සංවර්ධන ව්‍යාපෘති සඳහා පස් ලබා ගැනීම</td><td colspan="3">මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය පස් ලබාගැනීමේ නොහැකියාව හේතුවෙන් ව්‍යාපෘති කටයුතු ප්‍රමාදවීම් සිදුවන බවත් මේ සඳහා තිස්සමහරාම, හම්බන්තොට, තිස්සමහරාම සහ ඕකෙවෙල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල හඳුනාගන්නා ලද ස්ථාන නිරවුල්කර දැනුම්දී නොමැති බවට කරුණු ඉදිරිපත් විය.</td><td colspan="2">මෙම ගැටළුව සම්බන්ධව දිගින් දිගටම සාකච්ඡා කර ඇති බවත් අදාල සියළු අංශ සම්බන්ධීකරණය වෙමින් පස් ලබාගැනීමට අවශ්‍ය කටයුතු කඩිනම් කරගනිමින් ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීම සඳහා කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී.</td><td>දිස්ත්‍රික්කයේ සියළුම ගරු ප්‍රාදේශීය සභා සභාපතිවරුන්<br><br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්<br><br>කැනීම් ඉංජිනේරු, භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය</td></tr>
<tr><td>05.</td><td>මදූනාගල සංචාරක කලාපය සංවර්ධනය</td><td colspan="3">මදූනාගල සංචාරක කලාපය සඳහා ප්‍රධාන සංවර්ධන සැලැස්මක් සකස්කිරීමට නියමිත බවත් මෙම සැලසුම සඳහා ප්‍රතිපාදන වෙන්වී ඇති බවත් මෙකී සැලසුම සකස් කිරීමට අදාලව අදහස් හා යෝජනා ලබා දෙන ලෙස දැනුම් දෙන ලදී.</td><td colspan="2">මෙම සැලසුම සකස් කිරීමට අදාල සියළු පාර්ශව ඒකරාශි කරගනිමින් වරින්වර වෙනස් නොවන අයුරින් ස්ථිර සැලැස්මක් සකස් කරන ලෙසත් අදාල ආයතන මේ සඳහා සහයෝගය ලබා දෙන ලෙසත් උපදෙස් දෙන ලදී.</td><td>ප්‍රාදේශීය ලේකම්, සූරියවැව<br><br>කළමනාකාර අධ්‍යක්ෂ, රුහුණු සංචාරක කාර්යාංශය<br><br>අනෙකුත් අදාල ආයතන ප්‍රධානීන්</td></tr>
<tr><td>06.</td><td>වලස්මුල්ල නගරයේ නව නගර සැලසුමට යෝජිත ඉඩම් අවසතු කිරීම.</td><td colspan="3">මෙම නගරයේ නව සැලසුම් සකස්කිරීමට අදාලව අත්පත්කරගැනීමට යෝජිත ඉඩම් සම්බන්ධව අදාල ආයතන සමඟ දිගින් දිගටම සාකච්ඡාවීමෙන් අනතුරුව බස්නැවතුම්පල හා ඉන්ධන පිරවුම්හල හැර ඉතිරි ඉඩම් ගැසට්පත්‍රයක් මගින් අවසතු කර ඇති බවත් මෙම නගරය සංවර්ධනය කිරීමට යෝජනා ඉදිරිපත් වෙමින් තිබියදී තීරණයකට යොමුවීම හා මෙවැනි ක්‍රියාමාර්ගයකට යොමුවීමේදී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව දැනුවත් කිරීමකින් තොරව සිදුකිරීම සම්බන්ධව සහ එකී ඉඩම් නැවත අත්පත්කරගැනීමේ හැකියාව සම්බන්ධව කරුණු සාකච්ඡා විය.</td><td colspan="2">වලස්මුල්ල නගරය සංවර්ධනය කිරීමට යෝජනා ඉදිරිපත්වීම හේතුවෙන් මීට අදාල ඉඩම් නැවත අත්පත් කරගැනීමට පවතින නෛතික තත්ත්වය සම්බන්ධව සොයාබලා වාර්තා කරන ලෙස දැනුම් දෙන ලදී.</td><td>ගරු ප්‍රාදේශීය සභා සභාපති, වීරකැටිය.<br><br>ප්‍රාදේශීය ලේකම්, වලස්මුල්ල<br><br>නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය, හම්බන්තොට</td></tr>
</table>

**බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා**
**දිස්ත්‍රික් ලේකම් / දිසාපති**
**හම්බන්තොට**



CS CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 07. | සෞඛ්‍ය අංශයෙන් ඉදිරිපත් කරන ලද කරුණු. | මේ වන විට දිස්ත්‍රික්කය පුරා ඩෙංගු පාලනය යහපත් තත්ත්වයක පවතින බවත් ඉදිරියේදී වැසි කාලය එලඹෙන හෙයින් සතියකට පැය භාගයක් වෙන් කරමින් අවට පිරිසිදු කරගැනීමට යොමු වන ලෙසත් මේ සඳහා සියළු රාජ්‍ය ආයතන මැදිහත්වෙමින් මේ සඳහා සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන ලදි.<br>විශේෂයෙන් පන්සල් හා බස්නැවතුම්පොලවල් පිළිබඳ වැඩි සැලකිල්ලක් යොමු විය යුතු බවට සාකච්ඡා විය.<br>පන්සල් සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයන්හි සේවයේ නියුතු බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන්ගේ දායකත්වයක් මේ සඳහා ලබා ගැනීම සුදුසු බවට යෝජනා විය.<br>ග්‍රාමීය රෝහල්වල අවශ්‍ය පහසුකම් සොයාබලා අත්‍යාවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීම අවශ්‍ය බවට කරුණු ඉදිරිපත් විය. | සියළුම රාජ්‍ය ආයතන නිලධාරීන් සතියේ නිශ්චිත දිනයක් භාඅවම පැය ½ ක් වත් වෙන්කරගෙන පවිත්‍රතා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් දෙන ලදි.<br>ග්‍රාමීය රෝහල් පද්ධතිය සම්බන්ධව ස්ථානීය පරීක්ෂණ සිදුකර අවශ්‍යතා හා ප්‍රමුඛතා හඳුනාගැනීම සිදුකලයුතු බවත් උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික්කයේ සියළුම ආයතන ප්‍රධානීන් |
| 08. | දිස්ත්‍රික්කය තුළ පවතින ආරක්ෂක තත්ත්වය පිළිබඳ දැනුවත් කිරීම. | දිස්ත්‍රික්කයේ ආරක්ෂාව සම්බන්ධව උපරිම සේවාවක් ලබා දෙන අතර එහිදී වැටලීම් කටයුතු වලදී මාර්ගගත වංචා අපරාධ වලට හසුවන ගැටලු සම්බන්ධ වැටලීම් ප්‍රමාණය ඉහලයාමක් වාර්තා වන බවත්,<br>ජාතික මෙහෙවර වැඩසටහන යටතේ ජාතික, දිස්ත්‍රික් සහ ප්‍රාදේශිය වශයෙන් මෙහෙයුම් කමිටු ස්ථාපනය කිරීම් සිදුවන බවත්<br>අනාරක්ෂිත දරුවන් හඳුනාගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක වීමේදී ඒ සඳහා අවශ්‍ය මැදිහත්වීම ලබාදෙන ලෙස ඉල්ලීම් කරන ලදි.<br>ඩිජිටල් බැංකුකරණ යෙදුම මඟින් ගෙවීම් සිදුකිරීමට අවශ්‍ය පහසුකම් ලබාදී ඇති බවට පැහැදිලි කරන ලදි.<br>මේ වනවිට වයස අවුරුදු 12 – 18 පාසල් දරුවන් ගැබ් ගැනීමේ ප්‍රවනතාවයක් ඇති බවට කරුණු ඉදිරිපත් විය. | මෙම සියළු කරුණු සම්බන්ධයෙන් සියළු ආයතන ප්‍රධානීන්ගේ වගකීම් යටතේ තමතමන්ට හැකි සෑම අයුරකින්ම දායකත්වයක් ලබාදී මෙම සේවාවන් වඩාත් හොඳින් ලබාදීමට මැදිහත්වන ලෙස දැනුම් දෙන ලදි.<br>මෙසේ පාසල් දරුවන් අවධානමට ලක්වීම සම්බන්ධව වැඩි අවධානයක් යොමු කර අදාල වගකීම් දරණ සියළු අංශ මේ සම්බන්ධව මැදිහත්වී මෙම තත්ත්වය වෙනස් කරගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදි. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි , තංගල්ල<br>දිස්ත්‍රික්කයේ සියළුම ආයතන ප්‍රධානීන් |

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට



CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| 09. | සාකච්ඡාකරන ලද වෙනත් කරුණු | | | |
| 9.1 | වලව ගඟ මෝය ආශ්‍රිතව ජල පාලන ව්‍යාපෘතියක් යෝජනා කිරීම. | වසර ගණනාවක් තිස්සේ ගඟ මෝය ආශ්‍රිතව සිදුකරන ලද වී වගා ඉඩම් අක්කර 2000 කට ආසන්න ප්‍රමාණයකට සහ ඊට ආසන්න නිවාස වලට ගං මෝය පිරීම නිසා හානිකර බලපෑම්වලට ලක්ව ඇති බවත් දීර්ඝ කාලයක් මෙකී ගැටළු සඳහා විසඳුමක් නොලැබුන බවත් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර මෙකී ගැටළු විසදිය යුතු බවටත් කරුණු ඉදිරිපත් විය. | සංවේදී කලාපයක් වන මෙම වලව ගඟ ආශ්‍රිත කලාපය සංවර්ධනයේදී නිවැරදි ක්‍රමවේද අනුගමනය කරමින් අදාල ගැටලුවට විසඳුම් සෙවිය යුතු බවත් මැදිහත් වන ලෙසත් දන්වන ලදි. | දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ,<br><br>ප්‍රාදේශිය ලේකම්, අම්බලන්තොට. |
| 9.2 | 6 වන (ස්වෙච්ඡා) සන්නද්ධ බුද්ධි බලකා කඳවුර ස්ථානගතවී ඇති ඉඩම් කොටස යුද්ධ හමුදාව වෙත විධිමත්ව පවරා ගැනීම | මෙකී ඉඩම් කොටස පවරා ගැනීමේ ඉදිරි කටයුතු සඳහා හම්බන්තොට ප්‍රාදේශිය ලේකම් වෙත ඉදිරිපත් කර ඇති බවත් ප්‍රාදේශිය සංවර්ධන කමිටුවේ අනුමැතිය මේ සඳහා ලැබී ඇති බවත් දැනුම් දෙන ලද අතර මෙකී ඉඩමේ නීත්‍යානුකූල අයිතියක් නොමැති හෙයින් සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන නොලැබෙන බවට වැඩිදුරටත් පැහැදිලි කරන ලදි. | මෙම ඉඩම් කොටස සම්බන්ධව ස්ථානිය පරික්ෂණයක් සිදුකර වාර්තාවක් ලබා දෙන ලෙස තීරණය කරණ ලදි. | ප්‍රාදේශිය ලේකම්, හම්බන්තොට<br>නේවාසික ව්‍යාපාර කළමනාකරු, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය<br>මේජර්, කාර්ය නියුක්ත අණදෙන නිලධාරී, යුද්ධ හමුදා කඳවුර, නාගරවැව |
| 9.3 | වලව මව් නදී ප්‍රජා මූල සංවිධානය විසින් ඝණ මීටර් 700 ක පමණ ජල ගබඩා ටැංකියක් ලබාදෙන ලෙස ඉල්ලීම. | පවුල් 3500 කට අධික ප්‍රමාණයකට ජල පහසුකම් ලබාදීම සිදුකිරීමේදී ගැටළු මතුවන බවත් විශේෂයෙන් වැඩි ජල ඉල්ලුමක් පවතින උදෑසන සහ සවස් කාලයේදී ගැවුවක් පවතින හෙයින් රාත්‍රී කාලයේදී ජලය නිෂ්පාදනය කලත් ගබඩා පහසුකම් නොමැවීම හේතුවෙන් එය සිදුකල නොහැකි බවත් පැවුම් සහිත නියන් කාලවලදී ජල ඉල්ලුම වැඩි බවත් පැහැදිලි කර ජල ගබඩා ටැංකියක් ලබාදෙන ලෙස ඉල්ලීය. | කඩිනමින් මෙකී යොජනාව ලබා දෙන ලෙසත් ඊට අවශ්‍ය පියවර ගන්නා බවත් පැහැදිලි කරන ලදි. | ප්‍රාදේශිය ලේකම්, සූරියවැව |
| 9.4 | දකුණු පළාත් රාජ්‍ය නිලධාරීන් ස්ථානමාරු කිරීමේදී මතුවන ගැටලු අවම කර ගැනීම. | පළාත තුළ රාජ්‍ය නිලධාරීන් සඳහා ස්ථානමාරුවීම් ලබාදීමේදී මතුවන ගැටලු අවම කර ගනිමින් සිදුකරගැනීමට නිශ්චිත වැඩපිළිවෙලක් නොමැති වීම ගැටළුවක් බවත් දිස්ත්‍රික්කය සඳහා නිශ්චිත සැලසුමක් තිබීම අත්‍යාවශ්‍ය බවත් පෙන්වා දෙන ලදි. | 2026 වර්ෂයේ ස්ථාන මාරු කිරීම් සම්බන්ධව නිශ්චිත වැඩපිළිවෙලක් සකස් කරන ලෙස උපදෙස් දෙන ලදි. | ප්‍රධාන ලේකම්, දකුණු පළාත |

මීලඟ දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු රැස්වීම දෙසැම්බර් මස මැදබාගයේ පැවැත්වීමට යෝජිත බවත් ඒ සඳහා ඉලක්කගත ප්‍රගතියද සමඟ අදාල සියළුම නිලධාරීන්ගේ පැමිණීම අනිවාර්ය බවත් අද දින දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් පැමිණ සිටි සියලු දෙනාටම ස්තුතිය පල කිරීමෙන් අනතුරුව පස්වරු 1.30 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් කරන ලදි.

බිමල් ඉන්දුජිත් ද සිල්වා බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය හම්බන්තොට

2025 නොවැම්බර් මස ...14...............
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.



CamScanner